රුහුණ විශ්වවිද්‍යාලය

2014/2015 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 2000 ස්ථලය ප්‍රථම සහ පුනර්

දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

# ECN 2204 - මූල්‍ය න්‍යාය සහ ප්‍රතිපත්ති

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

01. (අ) අර්ථ ක්‍රමයක් තුළ මූල්‍ය අතරමැදිකරණයක අවශ්‍යතාව සහ එහි ආර්ථික වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) ප්‍රධාන වෙනස්කම් අවධාරණය වන පරිදි සෘජු මූල්‍යකරණය (Direct Financing) සහ වක්‍ර මූල්‍යකරණය (Indirect Financing) යන සංකල්ප පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) ශ්‍රී ලංකාවේ බැංකු නොවන මූල්‍ය අතරමැදියන්ගේ ස්වභාවය සහ කාර්යභාරය ඇගයීමකට ලක් කරන්න.

(ලකුණු 08)

02. (අ) සම්භාව්‍ය ආර්ථික ආදර්ශයේ (Classical Model) එන මුදලේ උදාසීනත්වය (Neutrality of Money) යන්නෙන් ඔබට අදහස් වන්නේ කුමක් ද?

(ලකුණු 08)

(ආ) අදාළ තැන්හි ප්‍රස්තාර සටහන් උපයෝගී කොටගනිමින් සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයින් විසින් මුදලේ උදාසීනත්වය තහවුරු කොට ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

03. (අ) "පොළී අනුපාතිකය තීරණය වීම පිළිබඳ ව සම්භාව්‍ය ආර්ථික විග්‍රහය මූර්ත සාධක අවධාරණය කරනු ලැබ ඇති අතර කේන්සියානු විග්‍රහය මූල්‍ය සාධක අවධාරණය කරනු ලැබ ඇත." අවශ්‍ය තැන්හි ප්‍රස්තාර සටහන් යොදා ගනිමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) මුදලට ඇති ඉල්ලුම පිළිබඳ ද්‍රවශීලතාවරණ න්‍යාය (Liquidity Preference Theory) විචාරාත්මක ව පරීක්ෂා කරන්න.

(ලකුණු 10)

04. "කේන්සියානු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අකාර්යක්ෂමය යන අදහස තහවුරු කිරීම සඳහා මූල්‍යවාදීන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රධාන තර්කයක් වන්නේ බාහිර තෙරපුම් ප්‍රතිවිපාක" (Crowding - Out Effect) පැහැදිලි කරන්න.

(ලකුණු 20)



52

05. IS – LM ආකෘතිය උපකල්පනය කරමින් පහත දැක්වෙන සිදුවීම් පොලී අනුපාතයටත් දළ ජාතික නිෂ්පාදිතයටත් කරන බලපෑම රූප සටහන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(i) බදු අනුපාතිකය
(ii) පරිභෝජන නැමියාව ඉහළ යාම.
(iii) මිල මට්ටම ඉහළ යාම. (ලකුණු 20)

06. (අ) 'ආර්ථික ස්ථායිතාව' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 08)

(ආ) "රටක ආර්ථික ස්ථායිකරණය සඳහා ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ සැපයුම් කළමනාකරණ ප්‍රතිපත්ති මිශ්‍රණයක් අවශ්‍ය වේ." පැහැදිලි කරන්න. (ලකුණු 12)

07. පහත දැක්වෙන සංකල්ප පැහැදිලි කරන්න.

(අ) සම්භාව්‍ය ආර්ථික විද්‍යාවේ එන ද්විමාකරණය (Dichotomy in the Classical Model) (ලකුණු 06)

(ආ) සම්භාව්‍ය අසමතුලිත ආදර්ශය (Fisher Model) (ලකුණු 07)

(ඇ) මුදල් ප්‍රමාණවාදී න්‍යායයේ ප්‍රතිප්‍රකාශනය (Restatement of Quantity Theory of Money) (ලකුණු 07)

@@@@@@@@@